ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>2,000කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් 12 වන ජාත්‍යන්තර යෝගා දිනය මහත් උද්‍යෝගයකින් කොළඹ දී පැවැත්වේ</u>**

12 වන ජාත්‍යන්තර යෝගා දිනය 2026 ජූනි 21 වන දින කොළඹ, ඓතිහාසික නිදහස් චතුරශ්‍රයේදී මහත් උද්‍යෝගයකින් සමරන ලදි. මෙම වැඩසටහන ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ එහි සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය (SVCC) විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හා එක්ව සංවිධානය කර තිබිණ. "සෞඛ්‍ය සම්පන්න අයුරින් වියපත් වීම සඳහා යෝගා" යන තේමාව යටතේ මෙවර ජාත්‍යන්තර යෝගා දිනය සමරන ලද අතර එමගින් සුවතාවයට වයස් සීමාවක් නොමැති බවට වන පණිවිඩය ලබා දෙන ලදි. එසේම, මෙම තේමාව තුළින් ජීවිතයේ සෑම අවධියකදීම සංවරණය, ශක්තිය, මානසික යහපැවැත්ම සහ ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීමෙහිලා යෝගා ව්‍යායාම විසින් ලබා දෙන ප්‍රබල දායකත්වය අවධාරණය කරන ලදි.

**2.** ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මහතා විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය ගරු මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ගරු වෛද්‍ය රිස්වි සාලි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය ගරු ප්‍රදීප් සුන්දරලිංගම්, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු නිශාන්ත ජයවීර යන මහත්වරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්, යෝගා මධ්‍යස්ථාන නියෝජිතයන් සහ වෙනත් ජ්‍යෙෂ්ඨ සම්භාවනීය අමුත්තන් රැසක් සමඟ යෝගා දින සැමරුම සඳහා එක් විය.

3. සාමය සහ යහපැවැත්ම සඳහා ආශිර්වාද කරමින් පරම ධම්ම චේතිය පිරිවෙනේ ස්වාමීන් වහන්සේලා සහ ආචාර්ය ධීරේන්ද්‍ර ක්‍රිෂ්ණ ශාස්ත්‍රි ජී තුමා විසින් පවත්වන ලද ආගමික වතාවත් වලින් අනතුරුව වැඩසටහන ආරම්භ විය. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම යෝගා මධ්‍යස්ථානවල ප්‍රවීණයන් විසින් පවත්වන ලද යෝගා සහ භාවන සැසියක් ඉන් අනතුරුව පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා යෝගා සඳහා උනන්දුවක් දක්වන්නන්, සම්භාවනීය අමුත්තන් සහ සිසු සිසුවියන් ඇතුළු දහස් ගණනක් දෙනා සහභාගී වූහ. කොළඹ පැවති ප්‍රධාන වැඩසටහන හා

සමගාමීව හම්බන්තොට සහ යාපනයේ පිහිටි ඉන්දීය කොන්සුල් ජෙනරාල් කාර්යාල සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය ද ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් විශේෂ වැඩසටහන් සංවිධානය කර තිබිණ.

4. ප්‍රධාන සැමරුමට පෙරාතුව, 2026 ජූනි 18 වන දින ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය හා එක්ව දිවයිනම ආවරණය කරමින් සුවිශේෂී වැඩසටහනක් සංවිධානය කරන ලදී. අඛණ්ඩව දෙවන වසරටත් පැවති මෙම වැඩසටහන යටතේ, ශ්‍රී ලංකාව පුරා ආයුර්විද රෝහල් 112ක එකම වේලාවක දී යෝගා සැසි පවත්වන ලදී.

5. AYUSH තොරතුරු මධ්‍යස්ථානයක් ද නිදහස් චතුරශ්‍රයේ සංවිධානය කර තිබූ අතර එමගින් පැමිණ සිටි පිරිසට ඉන්දියාවේ සාම්ප්‍රදායික වෛද්‍ය සහ සාකල්‍ය සුවතා ක්‍රම පිළිබඳව වටිනා තොරතුරු ලබා දෙන ලදී. සිද්ධාලේප ආයුර්වේද සමාගමේ වෛද්‍ය වෘත්තිකයන් විසින් නොමිලේ වෛද්‍ය උපදෙස් ලබා දෙමින්, අයුර්වේදයේ සාකල්‍ය වෛද්‍ය ක්‍රම සහ ප්‍රතිලාභ පිළිබඳව පැමිණ සිටි පිරිස දැනුවත් කරන ලදී.

6. 12 වන ජාත්‍යන්තර යෝගා දින සැමරුමේ කොටසක් ලෙස කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය රාජ්‍ය ආයතන, විශ්වවිද්‍යාල, වෘත්තීය ආයතන, පාසල් සහ සිවිල් සංවිධාන සමඟ සහයෝගයෙන් කොළඹ පවත්වන ලද යෝගා වැඩසටහන් 55කට පමණ දායකත්වය ලබා දුන්නේය. මේ අනුව ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කෝට්යාඩ් බයි මැරියට් කොළම්බෝ (Courtyard by Marriott Colombo), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය, කොළඹ මහ නගර සභාව සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය ඇතුළු ආයතන රැසක යෝගා වැඩසටහන් පැවැත්විණ. නිරෝගීභාවය සහ සාකල්‍ය සුවතාවය පිළිබඳ පණිවිඩය තවදුරටත් ශක්තිමත් කරමින් මෙම වැඩසටහන් සඳහා යෝගා ව්‍යායාමවල නිරතවන්නන්, සිසු සිසුවියන්, වෘත්තිකයන් සහ තවත් බොහෝ දෙනා මහත් උනන්දුවකින් සහභාගී වූහ.

7. 2014 වසරේදී ඉන්දියාවේ මූලිකත්වයෙන් ගෙන එන ලද යෝජනාවක් සම්මත කරමින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සෑම වසරකම ජූනි 21 වන දින “ජාත්‍යන්තර යෝගා දිනය” ලෙස නම් කරන ලදී. මෙම යෝජනාව සඳහා රටවල් 170ක් සහය ලබා දුන් අතර ශ්‍රී ලංකාව එහි සම අනුග්‍රාහකයකු විය.

***

**කොළඹ**
*2026 ජූනි 21*